# වෙලගම රජමහා විහාරයේ ඓතිහාසික පසුබිම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

**ඒකනායක එච්.එම්.එන්.එම්.**[1]

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ හතරලියද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් වෙලගම ග්‍රාමයෙහි පිහිටි වෙලගම රජමහා විහාරය ඓතිහාසික, පුරාවිද්‍යාත්මක හා කලාත්මක අංශයන්ගෙන් වැදගත් වන විහාරස්ථානයකි. අනුරාධපුර යුගයේ පටන් ලෙන් විහාරයක් ලෙස මෙම විහාරය වැදගත් වූයේ කෙසේ ද යන්න හඳුනා ගැනීම මෙම පර්යේෂණයේ අරමුණ විය. මූලාශ්‍රයගත කරුණු අනුව හෙළිදරව් වන ඓතිහාසික පසුබිම කෙබඳු ද යන්න මෙහි පර්යේෂණ ගැටලුව වේ. ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය අධ්‍යයනය මෙහි අධ්‍යයන ක්‍රමවේදය වශයෙන් භාවිත කරන ලදී. අනුරාධපුර යුගයේ වළගම්බා රජ දවස එල්ල වූ දකුණු ඉන්දීය ආක්‍රමණවලින් රට මුදවා ගැනීම සඳහා රජු වනගත ස්ථානවල සැඟ වී සිට සේනා සංවිධානය කළේ ය. ජනප්‍රවාදවලට අනුව වෙලගම රජමහා විහාරය ද වලගම්බා රජු සැඟ වී සිටි එවන් එක් විහාරස්ථානයකි. මහාවංසය ආදී මූලාශ්‍රය තුළ සඳහන් වෙලගම යනු වර්තමාන වෙලගම විහාරය යයි උපකල්පනය කළ හැක. කාලයාගේ ඇවෑමෙන් පරිහානියට පත් ව තිබූ විහාරය නැවත නඟා සිටුවන ලද්දේ මහනුවර යුගයේ වැලිවිට සංඝරාජ මාහිමියන් විසිනි. වෙලගම විහාරයේ ඓතිහාසික තත්ත්වය වෙලගම පුණ්‍යානුමෝදනාව නමින් පුස්කොළපතක සඳහන් වේ. සංඝරාජ සාධු චරියාව කෘතියේ මෙන් ම ලෝරි නම් ඉංග්‍රීසි වාර්තාවේ ද වෙලගම විහාරය පිළිබඳ සඳහන් වී තිබේ. විහාරස්ථාන භූමිය තුළ කටාර කෙටූ ගල් ලෙන් 5ක්, ලෙන් විහාරයක්, ස්තූපයක්, බෝධි වෘක්ෂයක්, සීමා මාලකයක් හා සෙල්ලිපියක් දක්නට ලැබේ. 1843 දී දේදුනුපිටියේ ධම්මපාල නම් තෙර නමක් විසින් රටේ මහත්තයකුගේ සහය ඇති ව කළ ප්‍රතිසංස්කරණයක් පිළිබඳ විහාර සෙල්ලිපියේ දැක්වේ. ලෙන් විහාර මන්දිර ත්‍රිත්වය තුළ දක්නට ලැබෙන සිතුවම් කලාව මහනුවර යුගයේ සිතුවම් සම්ප්‍රදායට අයත් වේ. පැරණි බිතුසිතුවම්, ඇතුළත පිහිටි ස්තූපය, මුචලින්ද නාගදරණය, බුද්ධ ප්‍රතිමාවලින් ලෙන් විහාර සමන්විත ය. ලෙන් විහාර අතරින් පල්ලේ විහාරය දඹුලු ලෙන් ආකෘතියට අනුව නිමවා ඇත. තේලපත්ත ජාතකය, සොලොස්මස්ථාන, දේවාරාධනාව, ලියවැල් මෝස්තර ආදී සිතුවම් මෙහි චිත්‍රණය කර ඇත. කැටයම් සහිත ශෛලමය උළුවහු හා ජනේල විශිෂ්ට නිර්මාණයන් වේ. උඩු විහාරයෙහි සංඝරාජ මාහිමියන්ගේ ප්‍රතිමාවක් ද පැරණි පින්තාලියක් ද දක්නට ලැබේ. මූලාශ්‍රයගත කරුණු, ජනප්‍රවාද, කලාත්මක හා වාස්තුවිද්‍යාත්මක නිර්මාණ තුළින් වෙලගම රජමහා විහාරයේ ඓතිහාසික පසුබිම මැනවින් පිළිබිඹු වන බවට නිගමනය කළ හැකි ය.

**මුඛ්‍ය පද** : කලාත්මක, පුරාවිද්‍යාත්මක, ඓතිහාසික, ලෙන් විහාර, වාස්තුවිද්‍යාව

[1] මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. nimeshaekanayake65@gmail.com